# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය

## මාර්ග සංවර්ධන අධිකාරිය

# ලංසු කැඳවීම

01. මාර්ග සංවර්ධන අධිකාරියේ ගාල්ල ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන ව්‍යාපෘති යටතේ මාර්ග වල ඇස්පෝල්ට් අතුරා සැකසීම සඳහා පහත සුදුසුකම්ලත් අයගෙන් මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

| අංකය | විස්තරය | දිස්ත්‍රික්කය | CIDA Grade | ලංසු ඇපකරය |
|---|---|---|---|---|
| 01 | මාර්ග සංවර්ධන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික්කයේ කි.මී. 100,000 විකල්ප මාර්ග පද්ධතිය ක්‍රියාත්මක කිරීම යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය/ වැඩිදියුණු කිරීම සඳහා යන්ත්‍රානුසාරයෙන් මාර්ග වල ඇස්පෝල්ට් අතුරා සැකසීම. (ඇස්පෝල්ට් කොන්ක්‍රීට් හා දියතාර සපයනු ලැබේ).<br>ප්‍රධාන ඉංජිනේරු කොට්ඨාශය, ගාල්ල<br>**කොන්ත්‍රාත් අංකය - RDA/SP/G/LBRRP/APL/2024-01** | ගාල්ල | C6 හා C7 | 100,000.00 |
| 02 | මාර්ග සංවර්ධන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික්කයේ කි.මී. 1,500 විකල්ප මාර්ග පද්ධතිය ක්‍රියාත්මක කිරීම යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය/ වැඩිදියුණු කිරීම සඳහා යන්ත්‍රානුසාරයෙන් මාර්ග වල ඇස්පෝල්ට් අතුරා සැකසීම. (ඇස්පෝල්ට් කොන්ක්‍රීට් හා දියතාර සපයනු ලැබේ).<br>විධායක ඉංජිනේරු කොට්ඨාශය, ගාල්ල<br>**කොන්ත්‍රාත් අංකය - RDA/SP/G/EEG/SP- 1500KM/APL/2024-01** | ගාල්ල | C6 හා C7 | 100,000.00 |
| 03 | මාර්ග සංවර්ධන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික්කයේ කි.මී. 1,500 විකල්ප මාර්ග පද්ධතිය ක්‍රියාත්මක කිරීම යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය/ වැඩිදියුණු කිරීම සඳහා යන්ත්‍රානුසාරයෙන් මාර්ග වල ඇස්පෝල්ට් අතුරා සැකසීම. (ඇස්පෝල්ට් කොන්ක්‍රීට් හා දියතාර සපයනු ලැබේ).<br>විධායක ඉංජිනේරු කොට්ඨාශය, හිනිදුම<br>**කොන්ත්‍රාත් අංකය - RDA/SP/G/EEH/SP-1500KM/APL/2024-01** | ගාල්ල | C6 හා C7 | 100,000.00 |

02. මිළ ගණන් කැඳවීම ජාතික තරගකාරී ලංසුකරන පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.

03. මිළ ගණන් පත් ගෙවීමකින් තොරව "ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය , මාර්ග සංවර්ධන අධිකාරිය, කොටුව, ගාල්ල " වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය.

04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2024.03.20 දින සිට 2024.04.01 දින දක්වා පෙ.ව.09.00 සිට ප.ව 03.00 දක්වා කාලය තුළ එක් මිළ ගණන් පතක් සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් 1,500.00 (සියලු බදු රහිත) ගාස්තුවක් බැගින් සහ ලිඛිත අයදුම්පතක් "ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය, කොටුව, ගාල්ල" වෙත ඉදිරිපත් කිරීමෙන් මිළ ගණන් ඉදිරිපත් කිරීමට අදාල අයදුම්පත් ලබාගත හැකිය.

05. සම්පූර්ණ කළ මිළගණන් පත් 2024.04.02 දින ප.ව. 02.00 ට පෙර "ප්‍රධාන ඉංජිනේරු " මාර්ග සංවර්ධන අධිකාරිය, කොටුව, ගාල්ල යන ලිපිනයට එවීම හෝ කාර්යාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදුකළ යුතුය. ප්‍රමාදවී ලැබෙන මිළ ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිළ ගණන් භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ එකී මිළ ගණන් විවෘත කරනු ලැබේ.

06. ඔබගේ මිළ ගණන් පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරෙහි "ඇස්පෝල්ට් අතුරා සැකසීම "යනුවෙන් හා කොන්ත්‍රාත් අංකය සඳහන් කළ යුතුය.

07. ලංසු අවසන් කරන දින සිට කැලැන්ඩර් දින 91 ක් දක්වා ලංසුව වලංගු විය යුතුය. ලංසුව ලංසු ලේඛනයේ සඳහන් කොට ඇති ප්‍රමාණයේ ලංසු ආරක්ෂණයකින් (ලංසු වලංගු කාලයේ සිට තවත් දින 28 ක් දක්වා වලංගු) සමන්විත විය යුතුය.වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ප්‍රධාන ඉංජිනේරු , ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය,කොටුව, ගාල්ල වෙතින් ලබා ගත හැක. දු.ක. 091-2234891

**සභාපති**

**ප්‍රසම්පාදන කමිටුව**

**ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,**

**මාර්ග සංවර්ධන අධිකාරිය, කොටුව, ගාල්ල**